ගම්පහ මහා නගර සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

ගම්පහ මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට ගම්පහ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහානගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1. පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම.

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට අදාළව ප්‍රමිතියේ 3 පරිච්ඡේදයේ 3.32 ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී එකතුව රු.530,117,268 ක දෝෂ සිදු කර තිබුණි.	ඉදිරි වර්ෂයේ ගැලපීම් කිරීමට කටයුතු කරන බව.	මුදල් ප්‍රවාහ ප්‍රකාශය ප්‍රමිතිය අනුව නිවැරදිව සකස් කළයුතුය.
(ආ)	මූල්‍ය ප්‍රකාශනවල නිර්දේශාත්මක ආකෘති සටහන් අංක 10 ප්‍රකාරව ප්‍රාග්ධන වියදම් දීමනා සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ ගැලපීම් කිරීමට කටයුතු කරන බව.	මුදල් ප්‍රවාහ ප්‍රකාශය ප්‍රමිතිය අනුව නිවැරදිව සකස් කළයුතුය

1.6.2. ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාග්ධන ප්‍රදාන සාවද්‍ය ගැලපීම සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කර තිබියදී, නැවත ක්‍රමක්ෂය ලෙස රු.7,517,053 ක් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම හරකර සමුච්චිත අරමුදලට බැර කර තිබුණි.	ගිණුම්ගත කර නොමැති බැවින් ගලපා ඇති බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ආ)	වරිපනම් දෝෂ නිවැරදි කිරීම රු.1,517,102 ක් සහ ආදායම් කපා හැරීම් රු.173,925 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගැලපිය යුතු වුවත් සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.	ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.4,821,993 ක් සමුච්චිත අරමුදලට ගලපා	ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.

	නොතිබුණු අතර, වත්කම් වගකීම් ප්‍රකාශයේ සමුච්චිත අතිරික්ත ගිණුමේ ශේෂය ලෙස රු.216,609,265 ක් දක්වනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ අතිරික්තය වූ රු.4,821,993 ක් දක්වා තිබුණි. වත්කම් වගකීම් ප්‍රකාශයේ ශුද්ධ වත්කම් වටිනාකම රු.7,491,070,534 ක් දැක්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට සමුච්චිත අතිරික්ත ගිණුමේ ශේෂය වූ රු.211,787,272 ක් දක්වා තිබුණි.		
(ඇ)	විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සමාලෝචිත වර්ෂය සඳහා ලැබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන හා අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන නිවැරදිව දක්වා නොතිබුණු අතර, වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම ලෙස සමාලෝචිත වර්ෂයේ අතිරික්තය වූ රු.4,821,993 ක් දක්වා තිබුණි.	ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය
(ඉ)	ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයෙහි අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන දක්වා නොතිබුණි.	ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.6.3. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණිත නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
එකතු වටිනාකම රු.403,746 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සම්බන්ධයෙන් බදු ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක පරිදි පරීක්ෂා කිරීමට නොහැකි විය.	අදාළ ආයතන දැනුවත් කර මුදල් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කරන බව.	අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1980 අංක 56 දරන ජාතික පාරිසරික පනතේ 23(අ) වගන්තිය	ආදාහනාගාර දෙක සඳහා බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	භූමියේ අයිතිය පවරා ගෙන බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බව.	පනතේ වගන්තිය අනුව කටයුතු කළ යුතුය.

(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
(i)	396 (ආ)	වටිනාකම රු.431,560 ක් වූ අගරු චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.	අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
(ii)	571	වටිනාකම රු.38,267,859 ක් වූ තැන්පතු නියාදනය කර නොතිබුණි.	ආදායමට හඳුනා ගැනීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	පළාත් පාලන කොමසාරිස්ගේ අංක ඩබ්ලිව්පී/එල්ජීඩී/01/2012 හා 2012 ජූලි 11 දිනැති චක්‍රලේඛයේ (VII) ඡේදය	සැලසුම් කමිටුවලට ක්ෂේත්‍ර නිලධාරීන්ගේ නිර්දේශ සතියක් ඇතුළත භාරදිය යුතු වුවත් දින 17 ත් 129 ත් අතර කාලයක් රඳවා තබා ගෙන තිබුණු ලිපිගොනු 18 ක් පැවතිණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.4,821,993 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.111,022,252 ක් විය.

2.2. ආදායම් පරිපාලනය

2.2.1. ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස්වරිය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.(000)	රු.(000)	රු.(000)	රු.(000)	රු.(000)	රු.(000)	රු.(000)	රු.(000)
(i)	වරිපනම් හා බදු	89,500	92,183	75,838	106,976	88,502	94,649	89,841	90,631
(ii)	කුලී	40,648	43,933	43,731	38,755	39,570	44,021	39,093	38,554
(iii)	බලපත්‍ර ගාස්තු	5,000	5,125	5,298	576	9,800	10,958	11,011	648
(iv)	වෙනත් ආදායම්	248,113	80,499	13,381	105,596	200,161	199,146	198,760	35,746
		---------	----------	---------	----------	-----------	---------	---------	----------
		383,261	221,740	138,248	251,903	338,033	348,771	338,705	165,577
		=======	=====	=====	======	======	=====	=====	======

2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වරිපනම් හා බදු		
(i)	හිඟ වරිපනම් කාලවිශ්ලේෂණ වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.83,788,502 ක් වූ හිඟ ශේෂය තුල, වර්ෂ 10 ට වැඩි ශේෂය රු.17,828,966 ක් ද, වර්ෂ 5 ත් 10 ත් අතර ශේෂය රු.29,639,983 ක් ද, වර්ෂ 3 ත් 5 ත් අතර ශේෂය රු.12,821,764 ක් ද, වර්ෂ 1 ත් 3 ත් අතර ශේෂය රු.13,780,602 ක් ද, වර්ෂ 1 ට අඩු ශේෂය රු.9,717,187 ක් ද විය.	හිඟ එකතු කිරීම සිදු කරගෙන යන අතර නිශ්චල දේපළ තහනම් කිරීමේ වැඩසටහනක් පැවැත්වූ බව.	හිඟහිටි වරිපනම් ආදායම් කඩිනමින් අය කළ යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂයේ බිල්කළ වරිපනම් ආදායම රු.78,357,087 ක් වූ අතර, රැස් කරගත් ආදායම රු.45,457,031 ක් වූයෙන් අයකර ගත් ප්‍රතිශතය සියයට 58 ක් වී තිබුණද, සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති රු.79,850,570 ක් වූ හිඟ වරිපනම් ශේෂයෙන් වර්ෂය තුල අය කරගත් ආදායම රු.16,594,371ක් වූයෙන් අයකර ගත් ප්‍රතිශතය සියයට 21 ක් වැනි අඩු අගයක් ගෙන තිබුණි.	ප්‍රධාන කාර්යාලයේ අයකරගත් ප්‍රතිශතය 74% ක් සහ 34% ක් බව.	හිඟහිටි වරිපනම් ආදායම් කඩිනමින් අය කළ යුතුය.
(iii)	වැරදි බිල් කිරීම් හඳුනාගෙන තිබුණු දේපල 8 ක හිඟ වරිපනම් ශේෂය රු.780,403 ක් සහ තහනම් කළයුතු බවට හඳුනාගෙන තිබුණු නිශ්චල දේපල 46 ක සහ චංචල දේපල 20 ක හිඟ වරිපනම් ශේෂය රු.1,688,260 ක් නිරවුල් කර ගැනීමට 2025 මැයි 29 දින දක්වා කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේ රු.212,468 ක් අයකළ අතර, නිශ්චල දේපළ තහනම් කිරීමේ වැඩසටහනකට කටයුතු කරමින් පවතින බව.	හිඟහිටි වරිපනම් ආදායම් කඩිනමින් අය කළ යුතුය.
(iv)	හිඟ ආදායම් වාර්තාව අනුව වර්ෂයේ බිල්කළ විනෝද බදු ආදායම රු.8,453,934 කින් වර්ෂය තුල අයකළ ආදායම රු.4,537,804 ක් වූයෙන් අයකර ගත් ප්‍රතිශතය සියයට 54 ක්වී තිබුණු අතර වර්ෂයේ ආරම්භක දිනට හිඟ හිටි විනෝද බදු ශේෂය රු.9,623,517 කින් වර්ෂය තුල අයකළ ආදායම රු.3,772,400 ක් වූයෙන් අයකරගත් ප්‍රතිශතය සියයට 39 ක් වැනි අඩු අගයක් ගෙන තිබුණි.	සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟ හිටි විනෝද බදු ශේෂය රු.9,623,517 කින් අයකළ ආදායම රු.4,830,356 කි.	හිඟ විනෝද බදු කඩිනමින් අය කළ යුතුය.
(v)	සිනමා ශාලාවකින් අයකර ගතයුතු හිඟ විනෝද බදු ශේෂය තුළ වර්ෂ 5 ත් 10 ත් අතර ශේෂය රු.3,851,349 ක් ද, වර්ෂ 3 ත් 5 ත් අතර ශේෂය රු.941,812 ක් ද වී තිබුණු අතර, 2017 දෙසැම්බර් 13 දින පවරන ලද 2023 මාර්තු 17 දිනැති නඩු තීන්දුව මගින් අයවියයුතු හිඟ විනෝද මුදල වන	සමාගම් ලේකම්ගේ ලිපිනය සොයා ගෙන ඇති අතර ඉදිරි පියවර ගැනීමට නියමිතය.	හිඟ විනෝද බදු කඩිනමින් අය කළ යුතුය.

	රු.3,851,349 ක් සහ පොළිය විත්තිකාර සමාගම විසින් ගෙවීමට ප්‍රකාශයට පත් කර ඇති නමුත් තීන්දුව ලබා දී වර්ෂ 2 ක් ගතවුවද 2025 මාර්තු 15 දින වන විටත් එම මුදල් අය කර ගෙන නොතිබුණි.		
(ආ)	කුලී		
(i)	ප්‍රධාන කාර්යාලයට අයත් කඩ කාමරවල හිඟ කඩ කුලී කාල විශ්ලේෂණ වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ ශේෂය රු.35,774,230 ක් තුල වර්ෂ 5 ත් 10 ත් අතර රු.18,638,759 ක් ද, වර්ෂ 3 ත් 5 ත් අතර රු.2,781,353 ක් ද, වර්ෂ 1 ත් 3 ත් අතර රු.4,938,523 ක් ද, වර්ෂ 1 ට අඩු රු.9,415,594 ක් ද වී තිබුණු අතර යක්කල උපකායීාලයට අදාලව හිඟ කඩ කුලී ශේෂය රු.2,949,510 ක් වී තිබුණු අතර කාල විශ්ලේෂණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.	සාවද්‍ය බිල් කිරීම් කපා හැරීමට සහ හිග කඩ පවරා ගැනීමට හෝ නෛතික කටයුතු කිරීමට සූදානම් කර ඇති බව.	හිඟ වෙළඳ ස්ථාන කුලී කඩිනමින් අය කළ යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති සතිපොල හිඟ බදු කුලිය රු1,305,206 කින් කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි.	මෙම 2021 වර්ෂයට අදාළ හිග මුදල අයකර ගැනීමට නෛතික කටයුතු අරඹා ඇති බව.	හිඟ සතිපොල කුලී අය කළ යුතුය.
(iii)	සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති මස්කඩ ටෙන්ඩර් කුලී රු.90,015 කින් කිසිදු මුදලක් අයකර නොතිබුණි.	මෙම 2021 වර්ෂයට අදාළ හිග මුදල අයකර ගැනීමට නෛතික කටයුතු අරඹා ඇති බව.	මස්කඩ ටෙන්ඩර් කුලී අය කළ යුතුය.
(ඇ)	**බලපත්‍ර ගාස්තු**		
(i)	සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති රු.1,157,190 ක් වූ කර්මාන්ත හා ව්‍යාපාර බදු හිඟ ශේෂයෙන් වර්ෂය තුල අය කිරීම් රු.139,675 ක් වූයෙන් අය කළ ආදායම සියයට 12 ක් වැනි අඩු ප්‍රතිශතයක් වී තිබුණි.	හිඟ ශේෂ සඳහා නඩු පවරා ඇති නමුත් ව්‍යාපාර හිමිකරු ව්‍යාපාරික ස්ථාන හා පදිංචිය හැරයාම නිසා නඩු කටයුතු ප්‍රමාද වී ඇති බව.	කර්මාන්ත හා ව්‍යාපාර බදු හිඟ ශේෂ අය කළ යුතුය.
(ii)	මහා නගර සභාව විසින් පවත්වා තිබුණු ගම්පහ තානායම් පාලනය 1980 සැප්තැම්බර් 09 දිනැති අංක 105/3 දරන ගැසට් පත්‍රයෙන් නාගරික සංවර්ධන අධිකාරිය සතුකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟ තානායම් කුලී ශේෂය රු.8,682,804 ක් සහ සමාලෝචිත වර්ෂයේ බිල්කළ වටිනාකම රු.1,250,539 ක් වුවද කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණු අතර අයකර ගැනීම සඳහා නගර සභාව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මෙම හිඟ අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	තානායම් ගාස්තු අය කළ යුතුය.

(ඇ) **වෙනත් ආදායම්**

(i)	හිඟ වාහන නවතා තැබීමේ ගාස්තු රු.2,147,954 ක් තුල වර්ෂ 1 ත් 5 ත් අතර ස්ථාන 5 කට අදාලව රු.624,303 ක් ද, වර්ෂ 5 ත් 10 ත් අතර ස්ථාන 4 කට අදාලව රු.1,523,651 ක් ද වී තිබුණි.	හිඟ ගාස්තු රු.2,147,954 ක් අය විය යුතු බව.	හිඟ වාහන නවතා තැබීමේ ගාස්තු අය කළ යුතුය.
(ii)	වාහන නැවතුම් ස්ථාන බදු දීම සම්බන්ධයෙන් රු.532,072 ක් අයකර ගැනීමට 2022 මැයි 20 දින නඩු 2 ක් පවරා තිබුණද, සිතාසි බෙදා හැරීම සඳහා අධිකරණයට නිවැරදි ලිපිනය ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.	නිවැරදි ලිපිනය ඉදිරිපත් කරන ලෙස අධිකරණය විසින් දන්වා ඇති බව.	හිඟ වාහන නවතා තැබීමේ ගාස්තු අය කළ යුතුය.
(iii)	වෙළඳ සංකීර්ණ 06 කට අදාල කඩ කාමර 29 කින් 2024 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ පෙර මුදල් ශේෂය රු.30,155,344 ක් අය කරගෙන නොතිබුණු අතර මේ තුල වර්ෂ 1 ත් 5 ත් අතර කඩ කාමරයක රු.433,287 ක් ද, වර්ෂ 5 ත් 10 අතර කඩ කාමර 8 ක රු.10,106,294 ක් ද, වර්ෂ 10 ත් 15 ත් අතර කඩ කාමර 7 ක රු.8,960,721 ක් ද, වර්ෂ 10 ට වැඩි කඩ කාමරයක රු.784,884 ක් ද හිඟව පැවති කාලය හඳුනාගත නොහැකි කඩ කාමර 11 ක රු.9,870,158 ක් ද අය කරගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.	සභාවට පවරා ගෙන හිඟ පෙර මුදල් කපා හැරීමට සහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. .	හිඟ පෙර මුදල් අය කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. **පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

මහා නගර සහා ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	ලැබී තිබුණු මහජන පැමිණිලි 111 ක් අතරින් 32 ක් පමණක් විසඳා තිබුණි.	ඉතිරි පැමිණිලි විභාග වෙමින් පවතින බව.	මහජන පැමිණිලි විසඳීමට කටයුතු කළ යුතුය.
(ආ)	වෙළඳ කුටියක් ඉදිකිරීම සඳහා 2022 නොවැම්බර් 18 දින මාස 3 කින් ඉටු කිරීමට ගිවිසුම්ගතවී වර්ෂ 2 කට අධික කාලයක් ඉකුත් වී තිබුණද, රු.1,876,479 ක් වූ කාර්යයන් 24 ක් 2025 මැයි 19 විගණිත දින වන විටත් නිමකර නොතිබීම හේතුවෙන් ගෙවා තිබුණු රු.2,104,014 ක අතුරු ගෙවීම අනාර්ථික වියදමක් වී තිබුණි.	ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් සභාව මඟින් සිදු කිරීමට කටයුතු කරමින් පවතින බව.	ඉතිරි වැඩ අවසන් කර ගොඩනැගිල්ල අරමුණුගත කාර්යය සඳහා භාවිතයට ගත යුතුය.

3.2. **කළමනාකරණ** අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මාර්ග සංවර්ධන අධිකාරිය විසින් යක්කල උපකාර්යාලයෙන් බිම් කොටසක් අත්පත් කර ගැනීම සම්බන්ධව පවරා ඇති 2022 ඔක්තෝබර් 17 දිනැති නඩුවට අදාලව රු.4,624,000 ක වන්දි සහ පොළී මුදල සභාවට ලබාදෙන ලෙස 2024 දෙසැම්බර් 12 දින දිසා අධිකරණයේදී නියෝගයක් ලබාදී තිබුණද එම මුදල 2025 මැයි 15 දින වන විටත් ලබාගෙන නොතිබුණි.	මෙම මුදල ඉක්මණින් මුදා හරින බව දිසා අධිකරණ කාර්යාලය විසින් පවසන ලද බව.	අදාල වන්දි මුදල් අය කර ගත යුතුය.
(ආ)	බැකෝ යන්ත්‍රයක හයිඩ්‍රොලික් ටැංකියට ඩීසල් යොදා තිබීම නිසා හදිසි සේවා කටයුත්තකට යොමු කිරීම සඳහා ගෙවන ලද මුදල සහ ඩීසල් ලීටර් 56.32 ක් සඳහා වැයවූ වියදම රු.259,258 ක් සම්බන්ධයෙන් මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ නියෝග 13 සිට 16 දක්වා කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී කටයුතු කරන බව.	මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ නියෝග අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	සුසාන භූමි මැනීම් කටයුතු සඳහා රු.691,410 ක වියදමක් දරා පිඹුරු පත් නිකුත් කර තිබුණ ද මායිම් සලකුණු කර ගෙන නොතිබීම හේතුවෙන් වියදම නිෂ්කාර්ය වී තිබුණි.	විස්තර ලබා දෙන ලෙස තාක්ෂණ නිලධාරීන් දැනුවත් කර ඇති බව.	මායිම් සලකුණු කර වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ගත යුතුය.

3.3. **මෙහෙයුම්** අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කඩ කාමර කඩා ඉවත්කිරීමට පෙර හිඟ කඩ කුලිය අයකරගත යුතු වුවත්, කඩා ඉවත්කළ පොදු වෙළඳපල කඩ කාමර 142 ක හිඟ කඩ කුලි ශේෂය රු.2,125,775 ක් විය.	2025 මැයි 28 වන විට රු.1,005,088 ක් කපා හැරීමට යොමු කර ඇති අතර රු.1,449,023 ක මුදල අයකරන බව	හිඟ කඩ කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	ගිවිසුමකින් තොරව ලබා දී පවත්වාගෙන යනු ලබන හා 2020 වාර්ෂික තක්සේරුව අනුව මාසික කුලිය රු.7,750 ක් සහ රු.7,000 ක් වූ කඩ කාමර 5 කින් කඩ කුලි ආදායමක් හඳුනාගැනීමට සහ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරි කටයුතු සඳහා කමිටු තීරණ ගැනීමට කටයුතු කරමින් පවතින බව.	ආදායම ලෙස හඳුනා ගැනීමටත් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඇ)	මහා නගර සභාවට අයත් කඩ කාමර 8 ක කඩහිමියන් දෙදෙනෙකු නමින් බිල්වෙමින් පැවතුණු හිඟ කඩ කුලී වටිනාකම රු.124,400 ක් වූ හෝටලය සම්බන්ධයෙන් ගිවිසුමක් නොතිබුණු බවද, කඩ කාමර තක්සේරුව 2023 ජූලි 15 දින අවසන්ව තිබුණු බවද, අනුමැතියකින් තොරව කඩ කාමර 8 හි බිත්ති ඉවත් කර ඉදිරියෙන් ගමන් කිරීම සඳහා වෙන් කර තිබූ අඩි 5 ක පමණ පළල කොරිඩෝව වීදුරුවලින් ආවරණය කර හෝටලයට සම්බන්ධ කරගෙන තිබුණු බවද, අනුමැතියකින් තොරව 2024 වර්ෂයේ ද ප්‍රතිසංස්කරණය කර තිබුණු බවද, හෝටලය පිටුපස පැවති මාවත සහ අඩි 15 ක් පමණ පළලින් යුතු ජලය බැස යාමේ කාණු පද්ධතිය ගේට්ටු දමා ඇතුල්වීමට නොහැකි ආකාරයට ආවරණය කර අනවසර ඉදිකිරීම් සිදුකර තිබුණු බවද නිරීක්ෂණය වූ අතර මහා නගර සභාව විසින් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතින අතර තක්සේරුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇති බව.	තක්සේරුව සිදු කර විධිමත් පරිදි ගිවිසුම් ගත විය යුතු අතර අනවසර ඉදිකිරීම් ඉවත්කළ යුතුය.

3.4. නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	වටිනාකම රු.666,135 ක් වූ නිල ඇඳුම් අයිතම 14 ක් බෙදා හැරීමට 2024 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණු අතර, මේ තුල රු.250,825 ක්වූ අයිතම 7 ක් වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට ද, වටිනාකම රු.96,350 ක්වූ අයිතම 2 ක් 2020 වර්ෂයේ සිට ද, වටිනාකම රු.318,960 ක් වූ අයිතම 5 ක් 2023 වර්ෂයේ සිට ද පැවත එමින් තිබුණි.	කමිටුවක් පත්කර වෙන්දේසි කිරීමට කටයුතු කරන බව.	අරමුණු ගත කාර්‍ය සඳහා භාවිතයට යෙදවීමට හෝ විධිමත්ව වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතුය.

(ආ)	මහා නගර සභා ආඥා පනතේ 188(1) වගන්තියට පටහැනිව සහා අරමුදලින් රු.854,400 ක් වැය කර 2023 පෙබරවාරි 14 දින සාරි 96 ක් මිලදී ගෙන සාරි 48 ක් නිලධාරීන් වෙත ලබාදී තිබුණු අතර රු.427,200 ක් වූ ඉතිරි සාරි 48 ක් 2025 මැයි 18 දින වනවිටත් ගබඩා කර තිබුණි.	කමිටුවක් පත්කර වෙන්දේසි කිරීමටත් මුදල් අයකර ගැනීමට පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරමින් පවතින බව.	පනතට පටහැනිව කටයුතු කර ඇති බැවින් වගකිව යුතු අයගෙන් අය කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	පහත මාලයේ වැඩ අවසන් කර ඉහල මහලය සඳහා කණු දමා බිත්ති භාගයක් බැඳ වහලයක් නොතිබුණු ප්‍රජා ශාලාවෙහි ස්ලැබ් එක පලුදු වී තීන්ත ගැලවී තිබුණු අතර ඉහළ මහළ ඉදිකිරීමට අදාල ලිපිගොණුව ඉදිරිපත් නොවුණු බැවින් නිෂ්කාර්යය වියදම සනාථ කරගත නොහැකි විය.	ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට ඇස්තමේන්තු සකසා ඇති බව.	වත්කම් භාවිතයට ගතහැකි පරිදි නිම කළ යුතුය.
(ඈ)	ගිනි නිවන ඒකකයේ සේවක මහතුන්ට නවාතැන් සැපයීම සඳහා මහල් 2 කට සැලසුම් කර ඉදි කළ තනි මහලේ ගොඩනැගිල්ල බිත්ති පුපුරා , ස්ලැබ් එක පහත් වී තිබුණු අතර ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාල ලිපිගොණුව විගණනයට ඉදිරිපත් නොවුණි.	මෙම ඉදිකිරීම සඳහා කිසිදු ගෙවීමක් සිදුකර නොමැත. ලිපිගොනු සෙවීම සඳහා ලේඛනාගාරයට යොමු කර ඇති බව.	වත්කම් නිසි පරිදි නඩත්තු කළ යුතුය.

3.5. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	සංවර්ධන නිලධාරීන් අනුමත සංඛ්‍යාව 2 ක් වුවත් 9 ක් අතිරික්තව පැවතුණු අතර නියෝජ්‍ය නාගරික කොමසාරිස් තනතුරක්ද, ගණකාධිකාරි තනතුරු 2 ක් ද, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තනතුරක් ද පුරප්පාඩුව පැවතුණි.	2002 වර්ෂයේ දී මහා නගර සභාවක් ලෙස ප්‍රකාශයට පත් වුවද, කාර්ය මණ්ඩලය වැඩිවීමක් සිදුවී නොමැති බව	පුරප්පාඩු පිරවීම කළ යුතුය.
(ආ)	සේවය අතහැර ගිය, විශ්‍රාම ගිය, විදුලිබල මණ්ඩලයට අනුයුක්ත කර තිබූ සේවකයන් 40 දෙනෙකුගෙන් රු.1,279,322 ක ණය හා අත්තිකාරම් ශේෂයක් අය වීමට පැවතුණි.	අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීමට කටයුතු කරන බව.	සේවක ණය අයකර ගත යුතුය.

3.6. වාහන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ධාවනයෙන් ඉවත් වී තිබුණු වෑන් රථයක් අළුත්වැඩියාව සඳහා යාන්ත්‍රික නිලධාරී, තාක්‍ෂණික නිලධාරී නිර්දේශය නොමැතිව 2024 මැයි 08 දින ආයතන 05 කින් මිල ගණන් කැඳවා තිබුණු අතර 2025 පෙබරවාරි 24 දින වනවිටත් රථය අළුත්වැඩියා කර ධාවනයට යොදවා නොතිබුණි.	2024 මැයි 08 දින යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශයක් නොමැතිව මිල ගණන් කැඳවා ඇති බැවින් නිර්දේශය සහිතව නැවත වරක් මිල ගණන් කැඳවා ඇති බව.	වත්කම් නිසි පරිදි නඩත්තු කළ යුතුය.
(ආ)	ගිනි රථයක් අළුත්වැඩියාව සඳහා දේශීය නියෝජිත ආයතනය වෙතින් ලැබී තිබුණු රු.6,250,000 ක ඇස්තමේන්තුව සඳහා ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ අනුමැතිය ලැබී තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටත් අළුත්වැඩියාව සඳහා යොමුකර නොතිබුණි.	ඉදිරියේදී කටයුතු කරන බව.	වත්කම් නිසි පරිදි නඩත්තු කළ යුතුය.

3.7. වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අයිතිය තහවුරු කර ගැනීම සඳහා පිඹුරුපත හා ඔප්පුව සභාව සතුව නොතිබුණු වර්ග අඩි 249 ක් වූ ගම්පහ නගරයට ආසන්නයේ පිහිටා ඇති පොදු ළිඳ 2024 වාර්ෂික වත්කම් සමීක්‍ෂණ වාර්තාව අනුව සභාවට අයත් ලෙස හඳුනාගෙන තිබුණද, ගිණුම්ගත කර නොතිබුණි.	මෙම භූමිය සභාව සතු වුවද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පාර පළල් කර සංවර්ධනය කිරීම සඳහා මෙම මාර්ගය භාවිතා කර ඇති නමුත් එම ආයතනයට පවරා දී නොමැති බව.	වත්කම්වල අයිතිය සහ ආරක්ෂාව තහවුරු කර ගත යුතුය.
(ආ)	අයිතිය තහවුරු කර ගැනීම සඳහා පිඹුරුපතක් පමණක් සභාව සතුව පැවති ළිඳ ගිණුම්ගත කර ද නොතිබියදී 2024 වාර්ෂික වත්කම් සමීක්‍ෂණයේදී හඳුනාගෙන තිබුණු අතර මෙම ස්ථානයේ ළිඳක් නොතිබුණු අතර පර්චස් 02 ක පමණ භූමි ප්‍රමාණයක් තිබුණි.	කුණු කසල ඉවත් කර මායිම්වැට සකස් කරන බව.	වත්කම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත කළ යුතුය.

(ඇ)	අයිතිය තහවුරු කර ගැනීම සඳහා පිඹුරුපත හා ඔප්පුව සභාව සතුව නොතිබුණු පොදු පහසුකම් ඉඩම ගිණුම්ගත කර නොතිබුණද 2024 වාර්ෂික ස්ථාවර වත්කම් සමීක්‍ෂණ වාර්තාව අනුව පර්චස් 48.7 ක් ලෙස අලුතින් හඳුනාගෙන තිබුණු අතර මායිම් හඳුනා ගැනීමට නොහැකි පරිදි වල් බිහි වී තිබුණි.	ඉදිරියේදී නිරාකරණය කරන බව.	වත්කම්වල අයිතිය සහ ආරක්ෂාව තහවුරු කර ගත යුතුය.
(ඈ)	ස්ථාවර වත්කම් සමීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත්කර තිබුණු හඳුනාගත් ඉඩම් 41 ක් අතුරින් ප්‍රමාණය අක්කර 4 යි රූඩ් 03 යි පර්චස් 29.4 ක් වූ ඉඩම් 06 කට පිඹුරුපත් සහ ඔප්පුද, ප්‍රමාණය අක්කර 03 යි රූඩ් 01 යි පර්චස් 17.19 ක් වූ ඉඩම් 07 කට පිඹුරුපත්ද, ප්‍රමාණය රූඩ් 6 යි පර්චස් 4.5 ක් වූ ඉඩම් 4 කට ඔප්පුද නොතිබුණු අතර අදාල පිඹුරුපත් සහ ඔප්පු පිළියෙලකර ගැනීමට නිර්දේශ කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී නිරාකරණය කරන බව.	වත්කම් සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය.
(ඉ)	සමීක්ෂණ මණ්ඩලය විසින් අලුතින් හඳුනාගත් ඉඩම් 15 කට අදාළ පිඹුරුපත් හා ඔප්පු සභාව තුළ නොමැති බවත්, අයිතිය තහවුරුකර ගැනීමට කටයුතු කළ යුතු බවත්, පවරා ගන්නා තුරු වැටමායිම් සකස් කර නාම පුවරු සකස් කළයුතු බවත්, නිර්දේශ කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. මෙයින් ඉඩම් 8 ක භූමි ප්‍රමාණය ද හඳුනාගෙන නොතිබුණි.	ආරක්ෂිත වැටක් ඉදිකිරීමට කටයුතු කරන බව.	වත්කම් සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය.
(ඊ)	2024 දෙසැම්බර් 31 දිනට අදාල වත්කම් සමීක්ෂණ වාර්තාවෙන්ද පෙන්වා දී තිබුණු ට්‍රැක්ටරයක්, ගල් රෝලක්, ත්‍රී රෝද රථයක්, අබලි ටේලරයක්, ජල බවුසර් ටේලරයක් සහ කසල වර්ගීකරණ ටේලරයක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා කටයුතු කරන බව.	වත්කම් සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය.
(උ)	ප්‍රජා මණ්ඩල ගොඩනැගිලි පැවතියද ප්‍රජා මණ්ඩල සඳහා බෙදන ලද ඇතැම් භාණ්ඩ මන්ත්‍රීවරුන්ගේ සහ ප්‍රජා මණ්ඩල නිලධාරීන්ගේ නිවෙස්වල තිබුණු බවද, ප්‍රජා මණ්ඩල 6 ක ඇඳි සහිත ප්ලාස්ටික් පුටු 300 කින් 121 ක් , LG –HIFF System 02 ක කැනපි හට් 2 ක් හා බුෆේ සෙට් 2 ක් ඌණතාවයන් ලෙස පැවති බව නිරීක්ෂණය විය.	මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා කටයුතු කරන බව.	වත්කම් වල ආරක්ෂාව තහවුරු කිරීමත් අලාභ අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

(ඏ)	2025 මැයි 19 විගණිත දින වනවිටත් 2024 වර්ෂයේ වත්කම් සමීක්ෂණ වාර්තාවේ සඳහන් කර තිබුණු පොදු නානළිං 03 ක භූමිය හඳුනා ගත නොහැකි වීම, පොදු නානළිං 07 ක් කැලෑවෙන් වැසී ඇති බැවින් මැනුම් කටයුතු කළ නොහැකි වීම, ළිං 2 ක අප ජලය බැස යාමට කාණු පද්ධතියක් නොමැති වීම, හිරුවලමුල්ල පොදු ළිදක් වසා කසල ගොඩගසා තිබීම සම්බන්ධයෙන් වූ නිර්දේශ පරිදි කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා කටයුතු කරන බව.	වත්කම් සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය.
(එ)	අක්කර 02 යි පර්චස් 17 ක් වූ නගර සභා ක්‍රීඩා පිටිය වටා යොදා ඇති දැල් වැට ගරා වැටී, අවට ඉඩම්වල ගස්වලට හේත්තු වී තිබුණි. ක්‍රීඩාපිටි නොමැති අසල පාසල් කිහිපයක්ම ක්‍රීඩාපිටිය ලෙස මෙය භාවිතා කරනු ලබන අතර බාහිර ආයතන හා පුද්ගලයින්ට වාණිජ කටයුතුවලට ලබා දීමෙන් මහා නගර සභාව 2024 වර්ෂය තුල රු.1,382,000 ක ආදායමක් ලබාගෙන තිබුණ බැවින් දැල් වැට පිලිසකර කිරීමට කටයුතු කළ යුතුව තිබුණි.	මේ සම්බන්ධයෙන් මේ වන විට ගත යුතු ක්‍රියාමාර්ග ගනිමින් සිටින අතර, සේවකයින්ගේ සහභාගිත්වයෙන් භූමිය පිරිසිදු කර ඇති බව.	දැල් වැට පිලිසකර කිරීමට කටයුතු කළ යුතුය.
(ඒ)	ගම්පහ මහා නගර සභාව සතු පර්චස් 2 ක ඉඩම වටා වැටක් ගසා ගේට්ටුවක් යොදා නිවසක් ඉදි කර තිබුණු අතර එහි වාහන නැවතුම් රථ ගාලක් පවත්වාගෙන යන නමුත් මහා නගර සභාව ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණු බවත් 2024 වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය අනුව එම ඉඩමෙහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	මෙම ඉඩම වටා මායිම් වැට සකස් කිරීමට ලිපි මඟින් දැනුවත් කර ඇති අතර, ඒ අනුව ඉදිරි වර්ෂයේදී ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව.	වත්කම් නිවැරදිව හඳුනාගෙන ආරක්ෂාව තහවුරු කර ගිණුම් ගත කළ යුතුය.
(ඔ)	ගම්පහ නගර මධ්‍යයේ පිහිටා ඇති පර්චස් 15 ක ඉඩමේ පිහිටි වටිනාකම රු.6,000,000 ක්වූ ප්‍රජා ශාලාවට විදුලි පහසුකම් ලබා ගෙන නොතිබුණු අතර කිසිඳු ප්‍රජා කටයුත්තක් සඳහා භාවිතා නොකරන බවත් භෞතික පරීක්ෂාවේදී ප්‍රජා ශාලාව තුල අනවසරයෙන් පුද්ගලයින් පදිංචි වී සිටින බවත් නිරීක්‍ෂණය විය. එහෙත් මහා නගර සභාව මේ සම්බන්ධයෙන් කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.	ගොඩනැගිල්ල අළුත්වැඩියා කටයුතු සිදු කර අනවසර පදිංචිකරුවන්ට ඉවත් වන ලෙසට දැනුම් දීමට කටයුතු කරමින් පවතින බව.	වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ගත යුතුය.
(ඕ)	වටිනාකම රු.3,965,000 ක් වූ නගර සභා ක්‍රීඩා පිටියේ ප්‍රේක්ෂකාගාරයේ කාමර 4 අතරින් කාමර 3 ක් බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් කාය වර්ධන උපකරණ සහ වෙනත් උපකරණ දමා වසා යතුරුද එම	ඉදිරියේදී ගැටළුව විසඳීමට කටයුතු කරන බව.	වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ගත යුතුය.

	පාර්ශවයන් විසින් රැගෙන ගොස් තිබුණි. මෙම කාමරවලට අදාල විදුලි බිල්පත හා ජල බිල්පත් නගර සභාව විසින් ගෙවීම් කරන නමුත් එම කාමරවල පාලනය නගර සභාවෙන් බැහැර වී තිබුණි.		
(ක)	බණ්ඩාරවත්ත ද පිනැන්ස් ඉඩම හඳුනාගත නොහැකි විය.	ඉදිරියේදී නිරාකරණය කිරීමට කටයුතු කරන බව.	වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ගත යුතුය.
(ග)	වටිනාකම රු.13,500,000 ක් සහ පර්චස් 45 ක් වන බදුවතුගොඩ සුසාන භූමියේ ඉහල කොටසට මායිම්ව පිහිටා ඇති ඉඩමේ පස් කපා තිබීම හේතුවෙන් සුසාන භූමියේ මායිම සෝදා පාළුවට ලක් වී කම්බි වැටට යොදා ඇති කොන්ක්‍රීට් කණු පහලට එල්ලී තිබෙනු නිරීක්ෂණය විය.	ආරක්ෂිත වැටක් ඉදිකිරීමට කටයුතු කරන බව.	වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ගත යුතුය.
(ජ)	වටිනාකම රු.24,000,000 ක් වූ පහල වීදිය වත්ත සුසාන භූමියට මායිම්ව පැති බැම්මක් (blinding wall) දමා ගොඩනැගිල්ලක් ඉදි කර තිබුණු අතර එම ගොඩනැගිල්ලේ වැසි ජලය හා අප ජලය කනත්ත දෙසට බැහැර කිරීම සඳහා බට යොදා තිබීම පිළිබඳව මහා නගර සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	මේ සම්බන්ධයෙන් තාක්‍ෂණ නිලධාරි දැනුවත් කර ඇති අතර, ඉදිරි කටයුතු සිදුකරන බව.	වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ගත යුතුය.

3.8. කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ප්‍රජා ශාලාවක උඩු මහල සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් මිනුම් හා ගෙවීම් වාර්තාවල ප්‍රමාණය‘7-0”,’3-0” ක් වන දොරවල් 02 ක් සහ ප්‍රමාණය ‘5-0”,’8-4” ක් වන දොරක් මෙම ගොඩනැගිල්ලට සවි කර ඇති බව සඳහන් කර තිබුණද භෞතික පරීක්ෂාවේදී ප්‍රමාණය ‘4-10”,’8-4” ක් වූ පියන් දෙකේ එක දොරක් පමණක් සවිකර රු.227,007 ක් වැඩිපුර ගෙවීම් තිබුණු බවද මිනුම් වාර්තාවේ සඳහන් නොවූ තනි පියනක් සහිත දොරක් සවිකර තිබුණු බව ද ප්‍රජා ශාලාව සඳහා ගෙවීම් වාර්තා හා මිනුම් වාර්තාවල සඳහන් සන්නම් නාමයට පටහැනිව බිත්ති විදුලි පංකා 4 ක් සවිකර තිබුණු බවද නිරීක්ෂණය විය.	කොන්ත්‍රාත් ලබාදුන් සමිතියෙන් රු.109,893 ක් අයකර ගැනීමට දන්වා ඇති බවක් වෙන්කර ඇති මුදලට Wall Mounted Fan සවිකර ඇති මුත් අතපසුවීමකින් බිල්පතේ සඳහන් කර නොතිබුණු බව.	ඇස්තමේන්තුවේ පරිදි කාර්යයන් සිදු කිරීමත්, වැඩිපුර ගෙවීම් අය කිරීමත් කළ යුතුය.